SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම -2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	ගිණුම්කරණය - I	කාලය Time	පැය 02

නම பெயர் Name	

උපදෙස් :

- **අංක 01 සිට 30 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.**

01. පහත දැක්වෙන කුමන ප්‍රකාශය ආයතනයක මූල්‍ය ගිණුම්කරණයේ මූලික කාර්යභාරය සම්බන්ධයෙන් නිවැරදි වේ ද?
(1) ආයතනයක ගණුදෙනු, මූල්‍ය පදනම මත ගිණුම් පොත්වල වාර්තා කරයි.
(2) ආයතනයක කළමනාකරුවන්ගේ භාවිතය සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි.
(3) ආයතනය පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි.
(4) ආයතනයක අයිතිකරුවන්ට තීරණ ගැනීම සඳහා අතීත සහ අනාගත තොරතුරු සපයයි.
(5) ආයතනයක වාර්ෂික විගණනයට අවශ්‍ය මූල්‍ය තොරතුරු සපයයි. (.....)

02. A – පුද්ගල සිරිත් විරිත්, ආකල්ප, සංස්කෘතිය
B – රජයක ආර්ථික ප්‍රතිපත්ති, විනිමය අනුපාතය, ඒක පුද්ගල ආදායම
C – ගිණුම් කටයුතු සඳහා පරිගණක මෘදුකාංග භාවිතය
D – නව සමාගම් පනත බලාත්මක වීම.
E – නව ගිණුම්කරණ ක්‍රම බිහිවීම හා පවතින ප්‍රමිත සංශෝධනය වීම.
ඉහත එක් එක් කරුණු අයත්වන ගිණුම්කරණ පරිසරයන් පිළිවෙලින් දැක්වෙන්නේ,
(1) නෛතික පරිසරය, ආර්ථික හා දේශපාලන පරිසරය, ශිල්පීය හා වෘත්තීය පරිසරය, සමාජ හා සංස්කෘතික පරිසරය, තාක්ෂණික පරිසරය
(2) සමාජ හා සංස්කෘතික පරිසරය, ආර්ථික පරිසරය, තාක්ෂණික පරිසරය, නෛතික පරිසරය, ශිල්පීය හා වෘත්තීය පරිසරය
(3) සමාජ හා සංස්කෘතික පරිසරය, නෛතික පරිසරය, ආර්ථික පරිසරය, තාක්ෂණික පරිසරය, ශිල්පීය හා වෘත්තීය පරිසරය
(4) ආර්ථික හා දේශපාලන පරිසරය, නෛතික පරිසරය, ශිල්පීය හා වෘත්තීය පරිසරය, තාක්ෂණික පරිසරය, සමාජ හා සංස්කෘතික පරිසරය
(5) සමාජ හා සංස්කෘතික පරිසරය, ශිල්පීය හා වෘත්තීය පරිසරය, තාක්ෂණික පරිසරය, නෛතික පරිසරය, ආර්ථික පරිසරය (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

03. පහත සඳහන් දෑ අතුරින් ගිනුම්කරණ නිමවුමක් ලෙස සැලකිය හැකි අයිතමය වන්නේ,

(1) මුදල් ලැබීම් ජනලය (2) මුදල් ගෙවීම් ජනලය (3) මුදල් පාලන ගිණුම

(4) මූල්‍ය තත්ව ප්‍රකාශනය (5) ශේෂ පිරික්සුම (.....)

04. පහත කාර්යයන් ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ සිදුවන නිවැරදි අනුපිළිවෙල කුමක් ද?

A – ගණුදෙනු සිදුවීම

B – ජර්නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම

C – ගණුදෙනු මූලික පොත්වල සටහන් කිරීම

D – ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

E – ලෙජර් ගිණුම් තුලනය කිරීම

(1) A, B, C, E, D (2) A, C, B, E, D (3) C, A, B, E, D (4) C, B, A, D, E (5) C, B, A, E, D

(.....)

05. ගිණුම්කරණ මූලිකාංගයක් වන වගකීමක් සම්බන්ධයෙන් පහත ලක්ෂණ දී ඇත. ඒ අතුරින් වගකීමක් හඳුනා ගැනීම සඳහා අදාල ලක්ෂණ පමණක් ඇතුළත් වන්නේ,

A – අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම

B – එය විශ්වාසදායී ලෙස මැනිය හැකිවීම

C – වර්තමාන බැඳීමක්

D – බැඳීම නිරාකරණයේදී අනාගතයේ ආර්ථික සම්පත් පිටතට ගලාගෙනයාම

(1) A, B, D (2) A, B, C (3) A, C (4) A, C, D (5) A, B, C, D

(.....)

❑ **අංක 6, 7, 8 සහ 9 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.**

2025.01.01 දින සුනිමල් සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි වී ඇත. 2025 ජනවාරි මාසයේදී පහත ගණුදෙනු ව්‍යාපාරයේ සිදු වී ඇත.

<u>අංකය</u>	<u>ගණුදෙනුව</u>
1)	පිරිවැය රු. 240000 ක් වූ භාණ්ඩ රු. 354000 කට කමල්ට ණයට විකිණීම (VAT 18% ඇතුළත් වේ.)
2)	රු. 30000 ක මුදල් වට්ටමක් ලබාදීමෙන් පසුව ලැබිය යුතු මුළු මුදල පියවීමට කමල්ගෙන් චෙක්පතක් ලැබීම.
3)	පිරිවැය 320000 ක් වූ භාණ්ඩ රු. 472000 කට අත්පිට මුදලට විකිණීම (VAT 18% ඇතුළත් වේ.)
4)	පිරිවැය 400000 ක් වූ භාණ්ඩ රු. 590000 කට විමල්ට ණයට විකිණීම (VAT 18% ඇතුළත් වේ.)
5)	රු. 118000 කට විමල්ට විකුණූ භාණ්ඩ ආපසු එවීම. (VAT 18% ඇතුළත් වේ.) මෙම භාණ්ඩවල පිරිවැය 80000 ක් විය.

06. ගණුදෙනු අංක 1 සහ 2 හි ශුද්ධ බලපෑම පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයිද?

	වත්කම් (රු'000)	=	**වගකීම් (රු'000)**	+	**හිමිකම් (රු'000)**
(1)	+84		+54		+30
(2)	+84		–		+84
(3)	+114		+54		+60
(4)	+114		–		+114
(5)	+144		+54		+90

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

07. ගණුදෙනු අංක 3, 4 සහ 5 හි ඒවා සිදු වූ අනුපිළිවෙල අනුව සුනිමල්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීම සඳහා භාවිතා කරනු ලබන මූලාශ්‍ර ලේඛන

(1) ලදුපත, ඉන්වොයිසිය, හරපත
(2) ලදුපත, ඉන්වොයිසිය, බැරපත
(3) තැම්පතු තුණ්ඩුව, ඉන්වොයිසිය, හරපත
(4) තැම්පතු තුණ්ඩුව, ඉන්වොයිසිය, බැරපත
(5) ලදුපත , ඉන්වොයිසිය, ජර්නල් වවුචරය

(.....)

08. 2025 ජනවාරි මාසය සඳහා සුනිමල්ගේ ව්‍යාපාරය විකුණුම් ජර්නලයේ එකතුව එහි පොදු ලෙජරයට පිටපත් කිරීම සඳහා නිවැරදි ද්විත්ව සටහන කුමක් ද?

	විස්තරය	හර (රු'000)	බැර (රු'000)
(1)	ණයගැති පාලන ගිණුම	800	
	VAT පාලන ගිණුම	144	
	විකුණුම් ගිණුම		944
(2)	ණයගැති පාලන ගිණුම	826	
	VAT පාලන ගිණුම		126
	විකුණුම් ගිණුම		700
(3)	ණයගැති පාලන ගිණුම	944	
	VAT පාලන ගිණුම		144
	විකුණුම් ගිණුම		800
(4)	මුදල් පාලන ගිණුම	472	
	ණයගැති පාලන ගිණුම	826	
	VAT පාලන ගිණුම		198
	විකුණුම් ගිණුම		1100
(5)	මුදල් පාලන ගිණුම	472	
	ණයගැති පාලන ගිණුම	944	
	VAT පාලන ගිණුම		216
	විකුණුම් ගිණුම		1200

(.....)

09. සුනිමල්ගේ ව්‍යාපාරයේ 2025.01.31 දිනට VAT පාලන ගිණුමේ ශේෂය (ගැණුම් මත VAT නොසලකා හරින්න) සහ ණයගැති පාලන ගිණුමේ ශේෂය

	VAT පාලන ගිණුමේ ශේෂය (රු'000)	ණයගැති පාලන ගිණුමේ ශේෂය (රු'000)
(1)	198 හර	430
(2)	126 බැර	472
(3)	144 බැර	502
(4)	198 බැර	472
(5)	216 බැර	502

(.....)

10. විකුණුම්, ආපසු එවුම්, කලින් ලද ගොඩනැගිලි කුලී, බැංකුවේ ඇති මුදල යන එක් එක් ගිණුම් වර්ග කළ හැක්කේ,

(1) ආදායම්, වත්කම්, වගකීම්, වගකීම් ලෙසය
(2) වත්කම් , ආදායම්, ආදායම්, වගකීම් ලෙසය
(3) ආදායම්, වත්කම්, වගකීම්, වත්කම් ලෙසය
(4) ආදායම්, ආදායම්, වත්කම්, වගකීම් ලෙසය
(5) ආදායම්, ආදායම්, වගකීම්, වත්කම් ලෙසය

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❑ **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත තොරතුරු භාවිතා කරන්න.**

ව්‍යාපාරයක සුළු මුදල් වියදම් වලට අදාලව තොරතුරු පහත දැක්වේ.

(i) ජනවාරි මස සුළු මුදල් වියදම්වල එකතුව රු. 9200 කි.
ජනවාරි 31 දිනට අත ඉතිරි මුදල රු. 800 කි.

(ii) පෙබරවාරි ආරම්භයේදී සුළු මුදල අග්‍රිමය රු.1000 කින් වැඩි කරන ලදී.

(iii) ජනවාරි මස සුළු මුදල වියදම හා සැසඳීමේදී

- පෙබරවාරි සුළු මුදල් වියදම රු. 850 කින් වැඩි වී ඇත.
- මාර්තු සුළු මුදල් වියදම රු. 500 කින් අඩු වී ඇත.

11. පෙබරවාරි මස අවසානයේදී ප්‍රතිපූරණය කළ මුදල

(1) රු. 850 (2) රු. 10050 (3) රු. 8350 (4) රු. 10000 (5) රු. 1850

(.....)

12. මාර්තු 31 දිනට සුළු මුදල් ශේෂය

(1) රු. 2300 (2) රු. 8700 (3) රු. 1300 (4) රු. 500 (5) රු. 3300

(.....)

13. පහත තොරතුරු සීමිත ලාභ් සමාගමට අදාළ වේ.

- බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 15000
- තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් රු. 9000
- නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් රු. 6000
- නිත්‍ය නියෝග මත බැංකුව රු. 2000 ක රක්ෂණ වාරික ගෙවා ඇත.
- ණයගැති සෘජු ප්‍රේෂණ රු. 4000 කි.
- බැංකුව අයකළ ගාස්තු රු. 1000 කි.

ව්‍යාපාරයේ සංශෝධනයට පෙර මුදල් පාලන ගිණුමේ ශේෂය වන්නේ,

(1) රු. 16000 (2) රු. 18000 (3) රු. 17000 (4) රු. 2000 (5) රු. 11000

(.....)

14. ව්‍යාපාරයක 2025.03.31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය එහි බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩි විය. මෙම වෙනසට හේතු විය හැක්කේ,

A – මුදල් පාලන ගිණුමට හර වූ නමුත් බැංකු ප්‍රකාශනයට බැර නොවූ චෙක්

B – මුදල් පාලන ගිණුමට බැර වූ නමුත් බැංකු ප්‍රකාශනයට හර නොවූ චෙක්

C – බැංකු ප්‍රකාශනයට පමණක් හර වූ බැංකු ගාස්තු

D – බැංකු ප්‍රකාශනයට පමණක් බැර වූ ණයගැති ප්‍රේෂණ

(1) A හා C පමණි (2) A හා D පමණි

(3) B හා C පමණි (4) B හා D පමණි

(5) A, B හා D පමණි (.....)

❑ **අංක 15 සහ 16 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී පහත තොරතුරු උපයෝගී කරගන්න.**

VAT සඳහා ලියාපදිංචි වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පියුමාල් රු. 300000 ක් වටිනා භාණ්ඩ 20% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට ගන්නා ලදී. පසුව මුදල් ගෙවීමේදී 10% ක මුදල් වට්ටමක්ද හිමිවිය. (VAT 10%)

15. ඉහත ගණුදෙනුවට අදාළව ගැණුම් ගිණුමේ සටහන් කළ යුතු වටිනාකම කොපමණ ද?

(1) රු. 135000 (2) රු. 216000 (3) රු. 240000 (4) රු. 264000 (5) රු. 270000

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

16. ඉහත ගණුදෙනුවට අදාළව ලද වට්ටම් ගිණුමේ සටහන් කළ යුතු වටිනාකම කොපමණ ද?

(1) රු. 12000 (2) රු. 24000 (3) රු. 26400 (4) රු. 28000 (5) රු. 30000

(.....)

❑ **ප්‍රශ්න අංක 17 සහ 18 සඳහා පහත තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

2025.03.31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු. 660000 විය. මෙම වටිනාකම ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුව සමඟ සමාන නොවීය. පසුව පහත වැරදි අනාවරණය විය.

(A) ගැණුම් ජර්නලයේ එකතුව රු. 80000 කින් අධි තක්සේරු වීම.

(B) ලද වට්ටමේ රු. 20000 ක් පොදු ලෙජරයේ පමණක් සටහන් නොවීම.

(C) ආපසු යැවුම් රු. 16000 ක් අදාළ ණය හිමියාගේ පෞද්ගලික ගිණුමේ වාර්තා නොවීම.

17. ණයහිමි පාලන ගිණුමේ නිවැරදි ශේෂය කොපමණ ද?

(1) රු. 540000 (2) රු. 690000 (3) රු. 576000 (4) රු. 560000 (5) රු. 542000

(.....)

18. ණයහිමි ශේෂ ලැයිස්තුවේ පැවති වටිනාකම කොපමණ ද?

(1) රු. 560000 (2) රු. 580000 (3) රු. 542000 (4) රු. 600000 (5) රු. 576000

(.....)

❑ **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 19, 20, 21 සඳහා පිළිතුරු සපයන්න.**

2025.03.31 දිනට ශක්ති සමාගම විසින් පිළියෙළ කරන ලද ශේෂ පිරික්සුම සම නොවීය. වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කර අවසන් ගිණුම් පිළියෙළ කරන ලදී. ආදායම් ප්‍රකාශයට අනුව ශුද්ධ ලාභය රු. 160000 කි. පසුව පහත පරිදි කරුණු අනාවරණය විය.

A – අත්පිට ගැණුම් රු. 52000 ක් මුදල් ගිණුමේ පමණක් වාර්තා වීම.

B – දුන් වට්ටම් රු. 12500 ලද වට්ටම් ගිණුමේ බැරට සටහන් වීම.
ණයගැති පාලන සහ පෞද්ගලික ගිණුම් වල නිවැරදිව වාර්තා කර ඇත.

C – විකුණුම් ජර්නලයේ එකතුව රු. 40000 කින් ඌනව තක්සේරු වී ඇත.

D – බැංකු ගිණුමේ ශේෂය රු. 50000ක් ශේෂ පිරික්සුමට උපුටා ගෙන නැත.

E – මෝටර් රථ අලුත්වැඩියා වියදම රු. 15000 ක් මෝටර් රථ ගිණුමට හර කර ඇත.

19. ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි මොනවා ද?

(1) $A\ B\ C\ D$ (2) $B\ C\ D\ E$ (3) $A\ B\ D\ E$ (4) $A\ B\ D$ (5) $A\ B\ C$

(.....)

20. වැරදි නිවැරදි කිරීමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ,

(1) රු. 122000 බැර (2) රු. 122000 හර (3) රු.127000 හර
(4) රු. 152000 බැර (5) රු. 142000 හර (.....)

21. ව්‍යාපාරයේ නිවැරදි ලාභය කොපමණ ද?

(1) රු. 88000 (2) රු. 120000 (3) රු. 108000
(4) රු. 150000 (5) රු. 112000 (.....)

22. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වෙළඳ ලැබිය යුතු දෑ, ගෙවිය යුතු දෑ, උපචිත වියදම් හා කලින් ගෙවූ වියදම් නමින් ගිණුම් වාර්තා වේ. මීට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) ප්‍රමාණාත්මක බවේ සංකල්පය (2) උපචිත සංකල්පය (3) ඒකක සංකල්පය
(4) ආරක්ෂණ සංකල්පය (5) මූල්‍ය මිණුම් සංකල්පය (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

23. පහත දැක්වෙන්නේ ව්‍යාපාරයක් විසින් අනුගමනය කළ ගිණුම්කරණ පිළිවෙත් කිහිපයකි.

A – තොගය පිරිවැයට වඩා ශුද්ධ උපලබ්ධි අගය අඩු නිසා එය ශුද්ධ උපලබ්ධි අගය දක්වා කපා හැර ඇත.

B – සේවකයෙක් විසින් වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇති බැවින් එම වන්දිය සඳහා වෙන් කිරීමක් සිදුකර ඇත.

C – ආර්ථික තීරණ ගැනීමට බලපෑමක් ඇති කරන තොරතුරු වෙනම හෙළිදරව් කර ඇත.

D – මූල්‍ය ප්‍රකාශන තුළ අයිතමයන් වර්ගීකරණය කිරීම හා ඉදිරිපත් කිරීම එක් කාල පරිච්ඡේදයක සිට ඊළඟ කාල පරිච්ඡේදය දක්වා ඒකාකාරීව සකස් කර ඇත.

ඉහත ගිණුම්කරණ පිළිවෙත් අනුකූල වන්නේ කුමන සංකල්ප වලට ද යන්න නිවැරදිව දැක්වෙන පිළිතුර තොරන්න.

	A	B	C	D
(1)	විචක්ෂණ	සංගතතා	විචක්ෂණ	ඓතිහාසික පිරිවැය
(2)	සංගතතා	ගැලපුම්	ඓතිහාසික පිරිවැය	විචක්ෂණ
(3)	විචක්ෂණ	විචක්ෂණ	ඓතිහාසික පිරිවැය	ගැලපුම්
(4)	ගැලපුම්	ගැලපුම්	ගැලපුම්	අනාවරණ
(5)	විචක්ෂණ	විචක්ෂණ	අනාවරණ	සංගතතා

(.....)

24. පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් සත්‍ය ප්‍රකාශන වන්නේ කුමන ඒවා ද?

A – ස්වරූපයට වඩා යථා තත්වය වැදගත් වීම, සම්මුතියෙන් දක්වන්නේ හැකි සෑම අවස්ථාවලදීම මූල්‍ය ප්‍රකාශන වල පිළිබිඹු විය යුත්තේ ගණුදෙනුවක හුදු නීතිමය ස්වරූපය නොව එහි ආර්ථික හරය බවය.

B – විචක්ෂණ සංකල්පයෙන් දැක්වෙන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වත්කම් වැඩියෙන් දැක්වීම හා බැරකම් වැඩියෙන් දැක්වීම යෝග්‍ය බවය.

C – ඓතිහාසික පිරිවැය සංකල්පයෙන් අදහස් කරන්නේ මුදල් වටිනාකමින් මැනිය හැකි අයිතමයන් පමණක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු බවය.

(1) ප්‍රකාශනයන් සියල්ල අසත්‍ය වේ.

(2) A ප්‍රකාශන සත්‍ය වන අතර B හා C ප්‍රකාශනයන් අසත්‍ය වේ.

(3) A ප්‍රකාශන අසත්‍ය වන අතර B හා C ප්‍රකාශනයන් සත්‍ය වේ.

(4) A හා B සත්‍ය වන අතර C ප්‍රකාශය අසත්‍ය වේ.

(5) ප්‍රකාශනයන් සියල්ල සත්‍ය වේ. (.....)

25. රත්මල් ව්‍යාපාරය සේවා සැපයීම කරන අතර 2025/03/31 දිනට අවසන් වර්ෂයේ පහත තොරතුරු ඔබට සපයයි.

– වසර තුළ මුදලින් ලද සේවා ආදායම්	රු. 180 000 කි.
– කාලච්ඡේදයේ අවසානයේ ලැබිය යුතු සේවා ආදායම්	රු. 40 000 කි.
– මුදලින් ලද සේවා ආදායම තුළ ඇති කලින් ලද සේවා ආදායම්	රු. 10 000 කි.
– වසර තුළ මුදලින් ගෙවූ සේවා වියදම	රු. 80 000 කි.
– කාලච්ඡේදය අවසානයේ ගෙවිය යුතු වියදම	රු. 10 000 කි.

– වසර තුළ ගෙවූ වියදම් වලින් රු. 12 000 ක් කලින් ගෙවූ වියදම් වේ

2025/03/31 දිනෙන් අවසන් වසරේ රත්මල් ව්‍යාපාරයේ උපචිත පදනමට ලාභය සහ මූල්‍ය පදනමට ලාභය නිවැරදිව දැක්වෙන්නේ?

	උපචිත පදනමට ලාභය රු.	මුදල් පදනමට ලාභය රු.
(1)	132 000	90 000
(2)	80 000	100 000
(3)	122 000	100 000
(4)	33 000	20 000
(5)	132 000	100 000

(.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

26. කමල්ගේ ව්‍යාපාරයේ 2025 වර්ෂය සඳහා දැනට ගණනය කර ඇති ලාභය රු. 118 000 කි. ඔහු විසින් පහත ගණුදෙනු සටහන් කර නොතිබිණි.

1) අයිතිකරු විසින් රු. 80000 ක් වටිනා තොග රැගෙන ගොස් තිබිණි. එහි විකුණුම් මිල රු. 90000 කි.

2) ණයට රු. 100 000 ක භාණ්ඩ විකුණා ඇති අතර ඔහුගෙන් රු. 60000 ක් පමණක් බැංකුවට ලැබී ඇති අතර වසර අග ණයගැතියන්ගෙන් අඩමාන ණය 10% ක් වෙන් කරයි. මෙම වරද නිවැරදි කිරීමෙන්,

	ලාභය (රු.)	ශුද්ධ වත්කම් (රු.)
(1)	70 000 අඩු වේ.	70 000 වැඩි වේ.
(2)	176 000 වැඩි වේ.	96 000 වැඩි වේ.
(3)	20 000 අඩු වේ.	176 000 අඩු වේ.
(4)	16 000 වැඩි වේ.	68 000 අඩු වේ.
(5)	100 000 අඩු වේ.	96 000 වැඩි වේ.

(.....)

❑ **පහත තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 27 හා 28 සඳහා පිළිතුරු සපයන්න.**

2025 මැයි 31 දින තරිඳුගේ ව්‍යාපාරයේ ගබඩාව ගින්කනික් විනාශ විය. පහත තොරතුරු පළමු මාස 05 සඳහා අදාළ වේ.

2025.01.01 දිනට තොගය	රු. 20 000
ගැණුම්	රු. 1 800 000
විකුණුම්	රු. 2 000 000
දළ ලාභය විකුණුම් මත 20%	

රක්ෂණ ආයතනය හානි වූ තොගයෙන් 80% සඳහා වන්දි ගෙවීමට එකඟ විය.

27. ගින්නෙන් හානි වූ මුළු තොග වටිනාකම කොපමණ ද?

(1) රු. 44 000 (2) රු. 356 000 (3) රු. 220 000
(4) රු. 400 000 (5) රු. 54 000 (.....)

28. ගින්නෙන් වූ තොග අලාභය කොපමණ ද?

(1) රු. 176 000 (2) රු. 220 000 (3) රු. 444 000
(4) රු. 400 000 (5) රු. 44 000 (.....)

❑ **පහත තොරතුරු නිෂ්පාදන ආයතනයකට අදාළය**

	(රු'000)
අමුද්‍රව්‍ය ගැණුම්	300
සෘජු ශ්‍රමය	200
නිෂ්පාදන පොදු කාර්ය	150
අමුද්‍රව්‍ය තොග වැඩිවීම	50
නොනිමි තොග අඩුවීම	10
නිමි තොග වැඩිවීම	150
විකුණුම්	600

29. මෙම ආයතනයේ නිෂ්පාදන පිරිවැය වන්නේ,

(1) රු. 610 000 (2) රු. 710 000 (3) රු. 860 000
(4) රු. 650 000 (5) රු. 510 000 (.....)

30. මෙම ආයතනයේ දළ ලාභය වන්නේ,

(1) රු. 40 000 (2) රු. 260 000 (අලාභය) (3) රු. 160 000 (අලාභය)
(4) රු. 80 000 (5) රු. 140 000 (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

❑ **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

31. මූල්‍ය ගිණුම්කරණය හා කළමනාකරණ ගිණුම්කරණය අතර පහත පහත නිර්ණායක වලට අනුව වෙනස්කම් දක්වන්න.

	මූල්‍ය ගිණුම්කරණය	**කළමනාකරණ ගිණුම්කරණය**
වාර්තා කරන කාලය	.....	.....
තොරතුරුවල ස්වභාවය	.....	.....

32. මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක රාමුවට අනුව මූල්‍ය තොරතුරු වල තිබිය යුතු මූලික ගුණාත්මක ගති ලක්ෂණ හා වැඩි දියුණු කිරීමේ ලක්ෂණ කවරේ ද?

මූලික ගුණාත්මක ගති ලක්ෂණ	**වැඩි දියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණ**
.....	.....
.....	.....

33. ඕෂන් ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත තොරතුරු දී ඇත.

	2024.04.01	**2025.03.31**
වත්කම්	?	**රු. 600 000**
වගකීම්	?	**රු. 360 000**

වර්ෂය ආරම්භයේ තිබූ වගකීම් වලට වඩා වර්ෂය අවසානයේ වගකීම් රු. 10 000 ක් වැඩිය. 2024/2025 වර්ෂය තුළ උපයා ඇති ලාභය රු. 60 000 කි. ගැනිලි හෝ අමතර ප්‍රාග්ධනය නැත.

1) වර්ෂය ආරම්භයේ ප්‍රාග්ධනය කොපමණ ද? රු. .....

2) වර්ෂය ආරම්භයේ වත්කම් කොපමණ ද? රු. .....

34. ව්‍යාපාරයක සිදු වූ පහත ගණුදෙනු හා සිද්ධි හේතුවෙන් එම වර්ෂය අවසානයේ දී වත්කම්, වගකීම් හා හිමිකම් වල අඩුවීම හෝ වැඩිවීම සටහන් කරන්න.

	ගණුදෙනුව / සිද්ධිය	**වත්කම්**	**වගකීම්**	**හිමිකම්**
A	අයිතිකරු ප්‍රාග්ධනය යෙදවීමට	.....	.....	.....
B	විදුලි බිල සහ වේතන ගෙවීම	.....	.....	.....
C	කාර්යාල උපකරණ ක්ෂය කිරීම	.....	.....	.....
D	බැංකු ණයක් ලබා ගැනීම	.....	.....	.....

35. පියුමල් සමාගම රු. 805 000 කට නිෂ්පාදන යන්ත්‍රයක් මිලට ගන්නා ලදී. එහි විකුණුම් මිලට 15% VAT එකතු වී ඇත. අවශ්‍ය වන්නේ,

(A) පියුමල් සමාගම VAT සඳහා ලියාපදිංචි වී ඇති සමාගමක් නම් අදාළ ද්විත්ව සටහන ලියන්න.

.....

.....

.....

(B) පියුමල් සමාගම VAT සඳහා ලියාපදිංචි වී නොමැති සමාගමක් නම් ද්විත්ව සටහන ලියන්න.

.....

.....

.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

36. පහත සඳහන් එක් එක් අයිතම හඳුනාගනු ලබන්නේ කුමන මූල්‍ය ප්‍රකාශන මූලිකාංගය යටතේ ද?

	ගිණුම	මූලිකාංගය
1)	හානි කරන අලාභය සඳහා ඉඩ හැරීම්	.....
2)	ආපසු එවුම්	.....
3)	ක්ෂය වෙන්කිරීම්	.....
4)	ගැනිලි	.....

37. ලී බඩු නිෂ්පාදනය කර විකුණන ව්‍යාපාරයක පහත එක් එක් ගණුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත වන්නේ,

	ගණුදෙනුව	මූලාශ්‍ර ලේඛනය	මූලික සටහන් පොත
1)	ලී බඩු නැවත මිලට ගැනීම සහ ණයට ගැනීම.	.....	.....
2)	කාර්යාල ප්‍රයෝජනයට ලී බඩු මිලට ගැනීම.	.....	.....
3)	ලී බඩු සඳහා ලී ණයට ගැනීම.	.....	.....
4)	බෙදා හැරීමේ රථයක් ණයට ගැනීම	.....	.....

38. ව්‍යාපාරයක 2025.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ණයගැතියන් සම්බන්ධව තොරතුරු පහත දී ඇත.

2024.04.01 දිනට ණයගැති ශේෂය	**රු. 120 000**
2025.03.31 දිනට ණයගැති ශේෂය	**රු. 180 000**
වර්ෂය තුළ බොල් ණය කපා හැරීම	**රු. 4 800**
කපාහල බොල් ණය ආපසු ලැබීම	**රු. 6 000**

සෑම වර්ෂයකම අවසාන ණයගැති ශේෂය මත 4% ක් අඩමාණ ණය ලෙස වෙන් කෙරේ.

(i) 2025.03.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ අදායම් ප්‍රකාශයේ හඳුනා ගන්නා ලද බොල්ණය හා අඩමාණ ණය (හානි කරන අලාභය) වටිනාකම කොපමණ ද? .....

(ii) 2025.03.31 දිනට ණයගැති ශුද්ධ වටිනාකමෙහි අඩුවීම හෝ වැඩිවීම කොපමණ ද?

.....

39. නිෂ්පාදන සමාගමක පහත එක් එක් අවස්ථාවට වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය සටහන් කරන්න.

	අවස්ථාව	ගිණුම්කරණ සංකල්පය
(A)	නිෂ්පාදන ගිණුමට නොනිමි තොග ගැළපීම	.....
(B)	සෑම ගිණුම් කාලච්ඡේදයක් සඳහාම නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීම.	.....
(C)	භාණ්ඩ භාරදීමට පෙර ගණුදෙනුකරුවන්ගේ ලද අත්තිකාරමක් වගකීමක් ලෙස හඳුනාගැනීම	.....
(D)	යන්ත්‍ර මත වෙන් කරන ලද ක්ෂය නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් ලෙස නිෂ්පාදන ගිණුමෙහි හඳුනා ගැනීම	.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

40. සීමිත පමෝෂා ශමල්කි සමාගමෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ උදාහරණයක් පහත දැක්වේ.

(A) ⟶ **සීමිත පමෝෂා ශමල්කි සමාගම**

(B) ⟶ **2025.03.31 දිනට**

	මූල්‍ය තත්ව ප්‍රකාශනය		(රු. ශත)
(C) ⟶	<u>ජංගම නොවන වත්කම්</u>		
	දේපළ පිරියත උපකරණ		**xx**
	<u>ජංගම වත්කම්</u>		
	තොගය		**xx**
(D) ⟶	වෙළඳ ලැබිය යුතු දෑ		**xx**

ඉහත A, B, C සහ D සංකේත මගින් දක්වා ඇති අයිතම සඳහා පදනම් කරගනු ලබන ගිණුම්කරණ සංකල්ප දක්වන්න.

සංකේතය	සංකල්පය
A	.....
B	.....
C	.....
D	.....

41. පහත සඳහන් දෑ ආයතනයක පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවල සංරචක ලෙස සළකනු ලැබේද යන්න සඳහන් කරන්න.

	ඔව් / නැත
A - මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	.....
B - මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්	.....
C - අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව	.....
D - හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	.....

42. තනි පුද්ගල ව්‍යාපාරයක ගිණුම්කරණය සම්බන්ධයෙන් පහත එක් එක් ප්‍රකාශය සත්‍ය ද (T), අසත්‍ය ද (F) යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
A ව්‍යාපාරයේ ලාභය ගැනිලි ලෙස බෙදා හැරිය හැක.	.....
B අයිතිකරුට විකුණන ලද භාණ්ඩ ව්‍යාපාරයේ විකුණුම් ලෙස ගිණුම්ගත කෙරේ.	.....
C භාණ්ඩ පරිත්‍යාග, ව්‍යාපාරයේ වියදමක් ලෙස හඳුනාගත යුතුය.	.....
D මූදල් පදනම මත ගණුදෙනු සටහන් කරන විට ආදායම් ප්‍රකාශයක් පිළියෙල කිරීම අවශ්‍ය නොවේ.	.....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

පහත තොරතුරු පසන් සමාගමේ දේපළ පිරියත උපකරණ වලට අදාළව උපුටාගන්නා ලදී.

අයිතමය	මිලට ගත් දිනය	පිරිවැය (රු)	සුන්බුන් අගය (රු)	ඵලදායී කාලය (වර්ෂ)
ගොඩනැගිලි	2024/01/01	5 000 000	1 000 000	20
මෝටර් රථ	2024/07/01	4 000 000	500 000	10
යන්ත්‍ර	2024/10/01	2 000 000	—	05

වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ වාර්ෂිකව ක්ෂය කරයි.

43. 2024.12.31 දිනේ අවසන් වර්ෂයේ සමාගමේ ක්ෂය වියදම කොපමණ ද? .....

44. දේපළ පිරියත උපකරණ වල 2024.12.31 දිනට ධාරණ අගය කොපමණ ද? .....

45. රහල් හේලිත සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර, 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොරතුරු සපයා ඇත.

	(රු'000)
2024.04.01 ගෙවිය යුතු VAT	100
විකුණුම් (VAT සහිතව)	1120
ගැණුම් (VAT සහිතව)	560
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවූ VAT	150

VAT ප්‍රතිශතය 12% නම් 2025.03.31 දිනට VAT සම්බන්ධව වගකීම වන්නේ? .....

46. වඩාත්ම උචිත ගිණුම්කරණ සංකල්ප භාවිතා කරමින් පහත ප්‍රකාශ සම්පූර්ණ කරන්න.

A ..... සංකල්පයට අනුව වසරකට වැඩි ඵලදායී ජීව කාලයක් ඇති නමුත් සාපේක්ෂව අඩු වටිනාකමක් සහිත උපකරණවල පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල වියදමක් ලෙස සළකනු ලැබේ.

B ..... සංකල්පයට අනුව නිවැරදි විකුණුම් පිරිවැය ගණනය කිරීමට අවසන් තොගය අඩු කරයි.

C ..... සංකල්පයට අනුව ගිණුම් වාර්තාවල ප්‍රාග්ධනය හා ගැනිලි වෙනම දැක්වීම.

D ..... සංකල්පයට අනුව ව්‍යාපාරයක් තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කළ යුතුවේ.

47. සපත්තු නිෂ්පාදන ආයතනයක පහත දැක්වෙන එක් එක් පිරිවැය අයිතමය ඍජු හෝ වක්‍ර ලෙස වර්ග කරන්න.

(A) පදම් කළ සම් පිරිවැය .....

(B) කම්හල් කළමනාකරණ වැටුප් .....

(C) යන්ත්‍ර මෙහෙයුම්කරුවන්ගේ වේතන .....

(D) යන්ත්‍ර ක්ෂය .....

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

48. නිෂ්පාදන ව්‍යාපාර ආයතනයක ණයගැති පාලන ගිණුමේ ශේෂය වැඩි වීමට, අඩු වීමට හෝ වෙනස් නොවීමට පහත ගණුදෙනු හේතු වන්නේද යන්න සඳහන් කරන්න.

	ගණුදෙනුව	වැඩිවේ / අඩුවේ / වෙනස් නොවේ
(A)	ණයට විකුණූ භාණ්ඩ ආපසු එවීම.	.....
(B)	වර්ෂය තුළදී බොල් ණය කපා හැරීම.	.....
(C)	භාවිත කරන ලද යන්ත්‍ර ණයට විකිණීම.	.....
(D)	වර්ෂය අවසානයේදී අඩමාණ ණය වෙන් කිරීම.	.....

49. 2023/10/01 දින සීමිත තරුෂ සංකල්ප සමාගම ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලද අතර ඒ වෙනුවෙන් 2024/9/30 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා රු. 120 000 ක කුලියක් ගෙවන ලදී. 2025/09/30 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා 2024/10/01 දින ගෙවූ කුලිය රු. 160 000 කි. සමාගමේ ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ.

2024/12/31 වැනි දිනෙන් අවසන් වර්ෂයේ ලාභ අලාභ ගිණුමට අයකළ කුලිය හා එදිනට කලින් ගෙවූ කුලිය වන්නේ,

A ලාභ අලාභ ගිණුමට සටහන් කරන කුලිය රු. .....

B කලින් ගෙවූ කුලිය රු. .....

50. පහත සටහනේ හිස්තැන් පුරවන්න.

1) ප්‍රාථමික පිරිවැය = ... + ... + ...

2) නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය = ... + ... + ...

3) මුළු නිෂ්පාදන පිරිවැය = ... + ...

4) මුළු පිරිවැය = ... + ...

SLGURU.LK
For Educational Purpose Only

“An investment in knowledge pays the best interest.” — Benjamin Franklin

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Educat

ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම -2025
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

ශ්‍රේණිය Grade	12	විෂයය Subject	ගිණුම්කරණය - II	කාලය Time	පැය 03
නම பெயர் Name					

උපදෙස් :- පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. 2025.12.31 දිනට ශනුල්යාගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

විස්තරය	හර	බැර
2025.01.01 තොගය	17 000	
ගැණුම්	148 000	
විකුණුම්		355 000
ආපසු එවුම් හා ආපසු යැවුම්	11 000	3 000
ගෙනඒමේ කුලී	8 000	
වට්ටම්	400	2 400
තීරු බදු	2 400	
ලාභාංශ ආදායම්		13 500
කුලී හා වරිපනම්	2 100	
විදුලි ගාස්තු	1 200	
ගැනිලි	8 000	
කාර්යාල වියදම්	2 300	
කාර්යාල කුලී	4 000	
බොල් ණය	4 400	
වැටුප් හා වේතන	18 000	
ගෙන යාමේ කුලී	1 400	
බැංකු ගාස්තු	2 000	
ණය පොලී	6 800	
ප්‍රාග්ධනය		500 000
ඉඩම් (පිරිවැය)	400 000	
වෑන් රථය (පිරිවැය)	200 000	
ලී බඩු (පිරිවැය)	50 000	
ක්ෂය වෙන් කිරීම (2025.01.01)		
වෑන් රථය		15 000
ලී බඩු		10 000
ආයෝජන	90 000	
ණයගැති හා ණයහිමි	43 000	112 500
ලද කොමිස්		24 500
අඩමාණ ණය වෙන්කිරීම (2025.01.01)		2 000
අතැති මුදල්	25 900	
බැංකු අයිරාව		8 000
	1 045 900	1 0459 00

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

පහත සඳහන් අතිරේක තොරතුරු සැලකිල්ලට ගන්න.

(i) 2025.12.31 දිනට භෞතික තොගයේ පිරිවැය රු. 22000 කි.

(ii) 2025 දෙසැම්බර් මාසයේදී විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද භාණ්ඩ වල ඉන්වොයිසි මිල රු. 6000 කි. මෙම තොග ගිණුම් වර්ෂය අවසාන වන විටත් විකිණී නොතිබිණි. පිරිවැයට 20% ක ලාභාන්තිකයක් එකතු කර භාණ්ඩ ඉන්වොයිස් කර ගිණුම්ගත කර ඇත.

(iii) ස්ථාවර වත්කම් පහත පරිදි සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කෙරේ.

- වෑන් රථ 10%
- ලී බඩු 5%

(iv) ණය ගැතියන් රු. 3000 ක් බොල්ණය ලෙස කපාහල යුතු අතර ඉතිරි ණය ගැතියන්ගෙන් 10% ක් වන පරිදි අඩමාණ ණය වෙන්කළ යුතුය.

(v) වැටුප් හා වේතන ගිණුමේ ශේෂය දැක්වෙන්නේ සේවකයන්ට ගෙවන ලද ශුද්ධ වැටුපයි. දළ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් සේවකයන්ගෙන් අඩුකර ශුද්ධ වැටුප ගණනය කර ඇත. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා යෝජක දායකත්වය 15% කි. සේවක භාරකාර අරමුදල 3%. මේ සම්බන්ධ කිසිදු ගැලපිල්ලක් පොත්වල ඇතුළත් කර නැත.

(vi) 2025.12.31 දිනට උපචිත වියදම් මෙසේය.

- විදුලි ගාස්තු රු. 2 800
- කාර්යාල කුලී රු. 2 000
- කුලී හා වරිපනම් රු. 900

(vii) ලාභාංශ ආදායම් වශයෙන් තවත් රු. 3000 ක් 2025 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව ඇත.

(viii) අයිතිකරු රු. 3500 ක් වටිනා භාණ්ඩ පුද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇත. මේ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල ඇතුළත් කර නැත.

අවශ්‍ය වන්නේ

1. 2025.12.31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
2. 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 40)

02. ඩිතිර ව්‍යාපාරය VAT සඳහා ලියාපදිංචි වෙළඳ ආයතනයකි. ගැණුම් හා විකුණුම් ආශ්‍රිත VAT අනුපාතය 10% කි.

- 2024 ජූලි මාසය සඳහා ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් පහත දෑ උපුටා ගෙන ඇත.

(i) 2024/7/1 දිනට ලෙජර ගිණුම් ශේෂ

	රු'000
මුදල් පාලන	2 500
වෙළඳ ලැබිය යුතු	9 200
වෙළඳ ගෙවිය යුතු දෑ	6 800
VAT පාලන (බැර)	150

(ii) 2024 ජූනි මාසය සඳහා ලැබීම් හා ගෙවීම් පිළිබඳ විස්තර

	රු'000
අත්පිට විකුණුම් (VAT රහිත වටිනාකම)	1 500
අත්පිට ගැණුම් (VAT සහිත වටිනාකම)	880
වෙළඳ ලැබිය යුතු දෑ ලැබීම්	4 600
වෙනත් ගෙවිය යුතු දෑ ගෙවීම්	3 450
කොමිස් ආදායම් ලැබීම්	40

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

	මෙහෙයුම් වියදම් ගෙවීම්	2 400
	බැංකු ණය ලබා ගැනීම	3 500
	විදුලි බිල ගෙවීම	700
(iii)	මාසය තුළ දී වෙළඳ තොග ණයට ගැණුම්	රු'000
	දම්රෝ සමාගම (VAT සහිත)	4 620
	ධම්මික ලී බඩු (VAT රහිත)	3 000
(iv)	මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ණයට විකුණුම්	රු'000
	අකිඳුට (VAT රහිත)	7 000
	ජනිඳුට (VAT සහිත මිල)	4 400

(v) මාසය තුළ දී ණය පදනම මත රන්ජිත් ලී බඩු සමාගමෙන් ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ලබාගත් ලී බඩුවල ගැණුම් මිල රු. 350 000.

(vi) රු. 15 000 ක වෙළඳ ණය ගැතියකු බුන්වත් වී ඇති නිසා කපා හැරීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ

1. 2024 ජූලි මාසය සඳහා,
   - (i) මුදල් ලැබීම් ජනලය
   - (ii) මුදල් ගෙවීම් ජනලය
   - (iii) විකුණුම් ජනලය
   - (iv) ගැණුම් ජනලය
   - (v) පොදු ජනලය (ඉහත v හා vi සඳහා)
2. 2024 ජූලි මාසය සඳහා,
   - (i) මුදල් පාලන ගිණුම
   - (ii) වෙළඳ ලැබිය යුතු ණයගැති පාලන ගිණුම
   - (iii) වෙළඳ ගෙවිය යුතු (ණයහිමි) පාලන ගිණුම
   - (iv) VAT පාලන ගිණුම (ලකුණු 40)

03. පසන්ගේ ව්‍යාපාරයේ 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයේ රු. 500 000 ක ලාභයක් වාර්තා කරන ලදී. 2025.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ රු. 60000 ක මුදල් ශේෂයක් පෙන්වන ලදී. කෙසේ වුවද ඔහු ගිණුම් පොත් නිසි ආකාරයෙන් පවත්වා නොගනී. පහත ගණුදෙනු ගිණුම් පොත්වල වාර්තා කර නොමැති බව පසුව හෙළිදරවු විය.

අංකය	ගණුදෙනුව
01	රු. 60 000 කට භාණ්ඩ ණයට විකිණීම. මෙම භාණ්ඩවල පිරිවැය රු. 30000 ක් විය.
02.	ගණුදෙනු අංක 01 ට අදාළව ඉන්වොයිස් වටිනාකම රු. 20000 ක් වූ භාණ්ඩ ගණුදෙනුකරුවන් විසින් ආපසු එවීම.
03	පිරිවැය රු. 5000 ක් වූ භාණ්ඩ පරිත්‍යාග කිරීම.
04	ව්‍යාපාරයේ රක්ෂණ වියදම රු. 10000 ක් විය. මෙයින් රු. 6000 ක් පසන් විසින් පුද්ගලිකව ගෙවන ලද අතර, ඉතිරිය ව්‍යාපාරය විසින් ගෙවන ලදී.
05	2024.07.01 දින 12% ක වාර්ෂික පොළියකට රු. 600000 ක බැංකු ණයක් ලබා ගැනීම. පොළිය මෙතෙක් ගෙවා නැත.
06	2025.03.31 දින රු. 380000 ක අත්පිට මුදලට ත්‍රී රෝද රථයක් මිලදී ගැනීම.
07	ණයගැතියෙකුගෙන් අයවිය යුතු රු. 20000 ක් ඔහුට ණයහිමියෙකු ලෙස ගෙවිය යුතු වූ රු. 45000 කට එරෙහිව හිලව් කිරීම, ඉතිරිය මුදලින් ගෙවන ලදී.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

08	රු. 12000 ක පසන්ගේ පෞද්ගලික ආදායම් බදු මුදලින් ගෙවා ඇත.
09	පෙර වර්ෂයේ දී කපාහල බොල්ණය නැවත ලැබීම. රු. 15000 කි.
10	ගණුදෙනු අංක 01 හා 02 ට අදාළ ලැබිය යුතු මුදල් 10% ක වට්ටමක් අඩු කිරීමෙන් පසු ලැබීම.

අවශ්‍ය වන්නේ

1. මෙම ගණුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිතා කරමින් පෙන්නුම් කර එක් එක් අගය ඉදිරියෙන් වැඩිවේ නම් (+) ද අඩුවේ නම් (−) ද යන්න සඳහන් කරන්න. පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.

ගණුදෙනු අංකය	වත්කම්				වගකීම්			හිමිකම්
	දේපළ පිරියත හා උපකරණ	තොග	වෙළඳ ලැබිය යුතු දෑ	මුදල්	දිගු කාලීන ණය	වෙළඳ ගෙවිය යුතු දෑ	වෙනත් ගෙවිය යුතු දෑ	

2. 2025.03.31 දිනට සංශෝධිත මුදල් ශේෂය
3. 2025.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය ගණනය කරන්න. (ලකුණු 40)

04. (අ) සඳමාල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වලින් 2025.12.31 දින පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

ණයගැති පාලන ගිණුමේ ශේෂය (හර)	රු. 54780
ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව	රු. 25720
ණයහිමි පාලන ගිණුමේ ශේෂය (බැර)	රු. 73680
ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුව	රු. 43340

ශේෂ ලැයිස්තුවේ එකතුන් පාලන ගිණුම්වල ශේෂයන් සමඟ එකඟ නොවූ හෙයින් මේ පිළිබඳ කරන ලද පරීක්ෂණයේදී පහත වැරදි හා අත්හැරීම් සොයාගන්නා ලදී.

1. ණයගැති ශේෂ ලැයිස්තුවෙන් රු. 3600 ක ණයගැතියෙකු මඟ හැරී ඇත.
2. ගෙවීම් ජනලයේ 2025 මාර්තු මාසයේ ණයහිමි ගෙවීම් විශ්ලේෂණ තීරුවේ එකතුව රු. 3000 කින් වැඩියෙන් සටහන් කර ඇත.
3. ණයහිමි ශේෂ ලැයිස්තුවේ රු. 5000 ක් අඩුවෙන් සටහන් කර ඇත.
4. ණයගැතියෙකුගෙන් අයවිය යුතු රු. 1600 එකතු කරගත නොහැකි ලෙස කපා හරින ලදී. මේ පිළිබඳ පොදු ජනලයේ සටහන් කරනු ලැබුවත් වෙනත් කිසිම සටහනක් තබා නොමැත.
5. විකුණුම් ජනලයේ නිවැරදි එකතුව වූ 34160 වැදීමකින් රු. 31460 ලෙස එකතු කොට පිටපත් කර තිබීම.
6. 2025 මාර්තු මාසයේ ණයහිමියන්ට ගෙවන ලද මුළු ගෙවීම්වල එකතුව රු. 28750 වැරදි සහගත ලෙස ණයගැති පාලන ගිණුමට හරකර ඇත.
7. රු. 400 ක් වූ ආපසු එවුම් ජනලයේ වාර්තා කර ඇත්තේ රු. 600 ක් ලෙසය.
8. රු. 1750 ක් වූ ඉන්වොයිසියක් ගැණුම් ජනලයේ නිවැරදිව සටහන් කර ඇතත් එය ණයහිමියාගේ පෞද්ගලික ගිණුමට පිටපත් කර ඇත්තේ රු. 1570 ලෙසය.
9. 2025 මාර්තු මාසයේ ණයගැතියන්ගෙන් ලද රු. 590 ක් වටිනා චෙක්පතක් අගරු විය. මෙය ගෙවීම් ජනලයේ ණයහිමියන්ගේ ගෙවීම් තීරුව යටතේ මෙය විශ්ලේෂණය කර ඇත. කෙසේ නමුත් උපයෝගී ලෙජරයේ ණයගැතියන්ගේ ගිණුමට නිවැරදිව පිටපත් කර ඇත.

අවශ්‍ය වන්නේ

1. අදාළ නිවැරදි කිරීම් සටහන් ඇතුළත් කරමින් ණයැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම පිළියෙල කරන්න.
2. ණයගැති හා ණයහිමි ශේෂ ලැයිස්තු නිවැරදි කිරීම සඳහා ගැලපුම් කර දක්වන්න.

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

(ආ) 2025 ජනවාරි 31 දිනට අමරගේ ව්‍යාපාරයේ පොත්වල දැක්වෙන බැංකු අයිරාව රු. 18000 කි. පහත හේතු නිසා එම ශේෂය බැංකු ගිණුමේ විස්තරයේ ශේෂයට සමාන නොවේ.

1. ජනවාරි මස නිකුත් කළ රු. 30000 ක චෙක්පත් වලින් ජනවාරි 31 වන විට ගෙවීමට ඉදිරිපත් කර තිබුණේ රු. 13500 ක චෙක්පත් පමණක් වීම.
2. ජනවාරි මස තැන්පත් කළ රු. 18500 ක චෙක්පත් වලින් රු. 4500 ක චෙක්පත් පමණක් බැංකුව විසින් පෙබරවාරි මස 03 වන දින ව්‍යාපාරයේ ජංගම ගිණුමට බැර කිරීම.
3. නිත්‍ය නියෝග මත බැංකුව ගෙවූ රු. 4500 ක රක්ෂණ වාරික වලින් රු. 1500 ක වාරික පමණක් මුදල් ගෙවීම් ජනලයේ සටහන් වීම.
4. ව්‍යාපාරයේ ආයෝජන සඳහා බැංකුවට ලැබී ඇති ලාභාංශ රු. 4000 ව්‍යාපාරයේ ගිණුම්වල සටහන් නොවීම.
5. ජනවාරි මස තැම්පත් කළ රු. 6200 ක චෙක්පත් අණකරු විමසනු වශයෙන් සටහන් කර බැංකුව ආපසු එවා ඇතත් ඒ පිළිබඳ සටහනක් ව්‍යාපාරයේ මුදල් පාලන ගිණුමේ ඇතුළත් නොවීම.
6. ව්‍යාපාරයේ මුදල් ගෙවීම් ජර්නලය රු. 5000 ක් වැඩියෙන් එකතු වී තිබීම.
7. සමාන නම සහිත ව්‍යාපාරිකයකු විසින් නිකුත් කරන ලද රු. 3000 ක චෙක්පතක් බැංකුව වැරදීමකින් මේ ව්‍යාපාරයේ ජංගම ගිණුමට හර කර තිබීම.

අවශ්‍ය වන්නේ

1. සංශෝධිත මුදල් පාලන ගිණුම
2. බැංකු සැසඳුම් විස්තරය (ලකුණු 40)

05. සමන් විසින් 2024.04.01 දින ක්‍රීඩා භාණ්ඩ අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2025.03.31 දිනට ව්‍යාපාරයේ පොත්වලින් උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

ශේෂ පිරික්සුම	(රු'000)	
ගිණුම	හර	බැර
ඉඩම	200	
ගොඩනැගිලි	240	
ලී බඩු උපකරණ	500	
ණයගැතියෝ	80	
ගැනිලි	60	
ගොඩනැගිලි ක්ෂය	18	
වේතන	120	
මුදල්	90	
විදුලිය	20	
වරිපනම් බදු	25	
ණය පොලී	20	
ප්‍රාග්ධනය		300
විකුණුම්		650
බැංකු ණය		200
ණයහිමියෝ		130
වෙනත් ආදායම්		20
අවිනිශ්චිත ගිණුම්		73
	1373	1373

ඉහත ශේෂ පිරික්සුම පිළියෙළ කිරීමෙන් අනතුරුව පහත කරුණු සොයාගන්නා ලදී.

1. ණයගැතියන්ගෙන් ලද රු. 15000 ක මුදලක් මුදල් ගිණුමේ පමණක් සටහන් කර ඇත.
2. ශේෂ පිරික්සුමේ දැක්වෙන ගොඩනැගිලි, පිරිවැයට දක්වා ඇත.
3. 2025.03.31 දිනට රු. 13 000 ක උපචිත විදුලිය, විදුලිය ගිණුමේ පමණක් වාර්තා කර ඇත.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

4. රු. 20000 ක විකුණුම් ඉන්වොයිසියක් පොත් වලින් මගහැරී ඇත.
5. රු. 36000 ක් වූ වේතන ගෙවීමක් වේතන ගිණුමට රු. 63000 ක් ලෙස හර කර ඇත.
6. බැංකු ණය 2024.04.01 වැනි දින ලබාගත් අතර වාර්ෂික පොළි අනුපාතය 12% කි. ණය වාරික ගෙවීම ආරම්භ කළ යුතු වන්නේ ණය ලබාගෙන වර්ෂ දෙකකට පසුවය. නමුත් පොළී ගෙවීම එම වසර දෙක තුළ සිදුකළ යුතුය.
7. ලී බඩු උපකරණ තුළ නැවත විකිණීම පිණිස මිලදී ගත් රු. 340000 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ද ඇතුළත්ව පවතී.
8. 2025.03.31 දිනට නොවිකිණී ඉතිරිව පැවති ක්‍රීඩා භාණ්ඩ පිරිවැය රු. 120000 ක් වූ අතර මේවායේ ඇස්තමේන්තුගත විකුණුම් මිල රු. 130000 ක් වූ අතර ශුද්ධ උපලබ්ධි අගය රු. 110000 ක් විය. මෙම ක්‍රීඩා භාණ්ඩ එදිනට විකිණීමට හැකි තත්වයේ පැවතුණි.
9. ලී බඩු උපකරණ වාර්ෂිකව 10% ක් බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය. ව්‍යාපාරයේ භාවිතය සඳහා මිලදී ගත් ලී බඩු උපකරණ 2024.04.01 වැනි දින අත්පත් කර ගෙන ඇත.

අවශ්‍ය වන්නේ

1. ඉහත එකිනෙක කරුණු ගැලපීම සඳහා ජර්නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම
3. 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
4. 2025.03.31 දිනට ශුද්ධ වත්කම්
5. අවසන් තොගය සම්බන්ධව ඇස්තමේන්තුගත විකුණුම් වියදම කීය ද? (ලකුණු 40)

06. VAT සඳහා ලියාපදිංචි වූ සියනෑ නිෂ්පාදන ව්‍යාපාරයේ 2025.03.31 දිනට ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

	හර (රු)	බැර (රු)
2024.04.01 දිනට තොගය		
අමුද්‍රව්‍ය	3500	
නොනිමි භාණ්ඩ	2500	
නිමි භාණ්ඩ	2500	
ගැණුම් - අමුද්‍රව්‍ය	6600	
- නිමි භාණ්ඩ	11000	
ආපසු එවුම් සහ විකුණුම්	2000	82500
ආපසු යැවුම් (අමුද්‍රව්‍ය සඳහා)		1000
ගෙනඒමේ කුලී (අමුද්‍රව්‍ය සඳහා)	3000	
පරිපාලන වියදම්	12000	
බෙදාහැරීමේ වියදම්	8000	
මූල්‍ය වියදම්	6000	
වෙනත් වියදම්	3500	
ණයගැතියෝ හා ණයහිමියෝ	6000	4000
කම්හල් කුලී	5000	
වෙනත් සෘජු නිෂ්පාදන වියදම්	1000	
ලිහිසි ද්‍රව්‍ය	1600	
පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	2000	
වරිපනම්	1200	
රක්ෂණ ගාස්තු	3000	
විදුලි ගාස්තු	2800	
දුරකථන වියදම්	1600	

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

ප්‍රාග්ධනය		300000
බැංකු ණය		20000
ගැණිලි	5000	
දේපල පිරියත උපකරණ හා 2024.04.01 දිනට ක්ෂය වෙන් කිරීම්.		
ඉඩම්	60000	
ගොඩනැගිලි	80000	20000
යන්ත්‍ර උපකරණ	50000	10000
කාර්යාල උපකරණ	40000	8000
බැංකු ශේෂය	125700	
	445500	**445500**

අතිරේක තොරතුරු

1. 2025.03.31 දිනට තොග පහත දැක්වේ.

අමුද්‍රව්‍ය	රු. 4200
නොනිමි භාණ්ඩ නිෂ්පාදන පිරිවැයට	රු. 2000
නිමි භාණ්ඩ	රු. 4400

2. වසර අවසන් වන විට රු. 200 ක විදුලි ගාස්තු ගෙවිය යුතුව පවතින අතර ඉදිරියට ගෙවා ඇති දුරකථන වියදම රු. 100 කි.
3. පහත වියදම් කම්හල සහ වෙළඳ අංශය අතර මෙසේ බෙදාහල යුතුය.

	කම්හල	වෙළඳ අංශය
වරිපනම්	60%	40%
රක්ෂණ ගාස්තු	70%	30%
විදුලි ගාස්තු	75%	25%
දුරකථන ගාස්තු	$\frac{1}{3}$	$\frac{2}{3}$

4. ගොඩනැගිලි වලින් $\frac{3}{4}$ ක් ද, කාර්යාල උපකරණවලින් $\frac{1}{4}$ ක ද යන්ත්‍ර උපකරණ 100% ක් ද කම්හල විසින් භාවිතා කරයි.
5. දේපල පිරියත හා උපකරණ පිරිවැය මත වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතුය.
6. පරිපාලන වියදම් තුළ රු. 10000 ක වේතන පවතී. වේතන විශ්ලේෂණය පහත දැක්වේ.

අමුද්‍රව්‍ය පැටවීමේ හා බෑමේ කරුවන්ට	20%
නිමි භාණ්ඩ පැටවුම් හා බෑමේ කරුවන්ට	10%
නිෂ්පාදන සේවක වේතන	30%
කම්හල් සේවක වේතන	15%
බෙදාහැරීමේ සේවක වේතන	10%
පරිපාලන සේවක වේතන	15%

7. ඉහත ගැණුම් හා විකුණුම් මත 10% ක VAT බදු ප්‍රතිශතයක් ඇතුළත්ව ඇත. (ආපසු එවුම් හා ආපසු යැවුම් සඳහා VAT බදු නොසලකා හරින්න)

අවශ්‍ය වන්නේ

1. 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම
2. 2025.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
3. 2025.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය (ලකුණු 40)

SLGURU.LK
For Educational Purpose Only

“An investment in knowledge pays the best interest.” — Benjamin Franklin

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.